ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2015 පෙබරවාරි 23 සඳුදා
07 වෙළුම - 17 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



Photo By : Sugath Pallewela

# ජේසුගේ දුක්ප්‍රාප්තියට පුංචි අපිත් සම්බන්ධ වෙමු !

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දුක්ප්‍රාප්ති සිහිවටන වලින් ඔබ්බට ගමනක්.......

## ආදරණීය දුවේ පුතේ...

සෑම වසරකම චතාරික සමය ආරම්භ වනවාත් සමඟම අපේ සැදැහැවත් ජනතාව ''පාද නමස්කාරය'' භක්ති අභ්‍යාසය සඳහාත් චතාරිකයේ සිහිපත් කරන දුක් ගාවිනා පිළිබඳ මෙනෙහි කිරීම සඳහාත් විවිධ ස්ථාන වල තිබෙන කල්වාරි පුදබිම් කරා වන්දනා චාරිකාවල යෙදෙනවා. අද වන විට විවිධ පදවි වල සිත් ගන්නා ස්ථානයන්හි කුඩා කඳු ගැට මත කල්වාරි පුද බිම් ගොඩ නඟා තිබෙනවා. පෙර කල ඉතාමත් සුළු සංඛ්‍යාවක්ව පැවති මෙම කල්වාරි පුදබිම් වර්තමානය වන විට සෑහෙන ප්‍රමාණයකට වැඩි වී තිබෙනවා. මේ අයුරින් මේ පුදබිම් වැඩිවී තිබෙන්නෙ ජනතාවගෙ තිබෙන මහත් ඕනෑකම හා උනන්දුව නිසයි.

ආදර දුවේ පුතේ  සමහර විට මේ මොහොත වන විටත් ඔබේ මිසමේ පියතුමා මීසම්වාසි ජනතාව සමඟ මේ චතාරික සමයේදී ඔබ ඉන්නා පදවිය තුළම හෝ නැතිනම් වෙනත් පදවියක පිහිටා තිබෙන කල්වාරි පුදබිමක් වෙත වන්දනා චතාරික ගමනක් සූදනම් කර තිබෙන්නට පුළුවන්. එහෙමත් නැතිනම් මේ වන විට එවන් චතාරික වන්දනා ගමනක් ගොස් සිටින්නට පුළුවන්. මෙහිදි අපගේ අවධානයට යොමු විය යුතු විශේෂ කරුණු කාරණා ගණනාවක්ම මේ හා සම්බන්ධව රැඳී පවතිනවා. චතාරිකය නැතිනම් කොරොස්ම සමය  තුළ අපි ශාරීරිකවත් යම් යම් දුෂ්කර අභ්‍යාසයන් වල යෙදිය යුතු බවට අපගේ විශ්වාසයේ අත්දැකීම් අපට මතක් කර දී තිබෙනවා. එක්වරු ශීලය, ගොඩමස් අනුභවයෙන් වැළකීම, මර්ධන ක්‍රියා, පාදනමස්කාරයේ යෙදීම ඉන් කිහිපයක්.  විශේෂයෙන් මේ කාල වකවානුවේදී සෑම සිකුරාද දිනකම අපගේ දේවස්ථාන වල කුරුසියේ පාද නමස්කාරයේ භක්ති අභ්‍යාසය පැවැත්වෙනවා. තවත් සමහර දේවස්ථාන හා මීසම් වල දින හතලිහේ මෙනෙහි කිරීමේ යැදුම් පැවැත්වෙනවා. දුක්ප්‍රාප්ති ප්‍රසංගය පැවැත්වීමට තවත් සමහර තැන් වල පිරිස් සූදනම් වෙනවා. මේ සියලු විශ්වාසයේ භක්ති අභ්‍යාස වලට සූදනම් වීම තුළින් මානසිකවත්, චෛතසිකවත්, ආධ්‍යාත්මිකවත් අපව මනාව සූදනම් කෙරුමට හොඳ මඟ පෙන්වීමක් කරනවා. ඒ හා සමඟම දුර බැහැරක තිබෙන කල්වාරි පුද බිමක් වෙත ගොස් මීසමක් සේ සහෝදරත්වයෙන් බැඳී පවත්වන භක්ති අභ්‍යාසයන් වලදීත් අපට මනා පුහුණුවක් ඇති කරවනවා, විශේෂ කොට භක්තිය තුළින් ශ්‍රද්ධාව වෙත ගමන් කිරීමට. විටෙක අව් රශ්මිය මැද්දේ දනින් වැටී අප ස්වාමින්වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම වැදිලා අත් විඳින එවන් භක්ති අභ්‍යාසයන් වලදී ඒ කල්වාරි පුද බිම පරිසරයත් අපව යාච්ඤා ධ්‍යානගත අත්දැකීම කරා ගෙන යන්නට මහත් සේ උපකාරී වනවා. ඒ සිහිපත් කරවීම හරියට එදා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මල් උයනේදී වින්දාවූ අත්දැකීමටම සම කරන්න පුළුවන්. මහා පිරිසක් මධ්‍යයේ වුවත් අපි එකිනෙකා අත් දකින පාළුව, කාංසිය හා තනිකම තුළ අපේ ජිවිත දුක දෙවි පියාණන් වහන්සේ වෙත කෑ ගසා පැවසීමට අපට මේ පුදබිම් සපයන්නේ මහඟු අත් වැලක්.

ආදර දුවේ පුතේ, මිනිස් අපගේ ජිවිත ඇතුලාන්තය තුළ මිරිකෙන වේදනාව, පාළුව, තනිකම, අසරණ බව තුනීකර ගන්නට අප කෑ ගසා යමක් පවසන විට යම් සහනයක් අපට ලැබෙන බව අපේ විශ්වාසයයි. එසේ නම් යාච්ඤා අත් දැකීමක් තුළ එවන් අත්දැකීමක් එයට උචිතම පරිසරයක ලබන විට කෙතරම් සහනයක්, සුවයක්, ජීවයක් අපට ලබා ගන්නට පුළුවන්ද? ''පාද නමස්කාරයේ'' භක්ති අභ්‍යාසය තුළ අපේ මෙනෙහි කිරීම්, යාච්ඤා, ගීතිකා , සරල යැදුම් හා පොදු යැදුම් ශබ්දනගා උච්චාරණය කරන කන්නලව්වක් සේ ඒවා එයටම උචිත පරිසරයක පුදන විට නිරායාසයෙන් ඒ භක්ති අභ්‍යාසය තුළින් ලබන මහත් ඵලය අපේ  ජිවිත ශ්‍රද්ධාව වැඩි දියුණු කරන්නට අපව පුරුදු පුහුණු කරනවා.

සා. ජුසේ වාස් මුනිතුමන්ගේ හා අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ පැරණි යාච්ඤා විධි ක්‍රම මේ සඳහා ඉමහත්ව ප්‍රයෝජනවත් වෙනවා. මල් උයනේ යාච්ඤාව, කය දුෂ්කර ප්‍රාර්ථනාව , ප්‍රතිකාර ප්‍රාර්ථනාව , වැනි ලයාන්විත යාච්ඤා පුන පුනා කරන උච්චාරණය තුළ ක්‍රම ක්‍රමයෙන් අපේ ජිවිත ඇතුලාන්තයට පුදුමාකාර සහනයක් සැනසීමක් ලැබෙනවා. කුරුසිය මුලික නිමිත්ත කොට ගෙන අපේ සියළු ජීවිත ඉලක්කයන් කුරුසිය වෙත පතිත කරලා අත් දකින මේ දුක්ප්‍රාප්ති යාච්ඤා ධ්‍යානයෙන් කුඩා කාලයේ සිට අප ලබන ඵල ප්‍රයෝජන ඉතා මහත් බව අපි අවබෝධ කර ගැනිම අනිවාර්යයයි.

ඉතින් ආදර දුවේ , පුතේ, මේ සියල්ල ඉෂ්ඨ සිද්ධ කරන්න වගේ තමයි බාහිර නිමිත්තක් සේ මේ කල්වාරි පුදබිම් සකස් වී තිබෙන්නේ. එම නිසා එවන් කල්වාරි පුදබිමක් කරා යන වන්දනා චාරිකාව විනෝද චාරිකාවක් වන්නට බැහැ. කොහෙත්ම අනිසි විනෝදයක් මෙයින් නොලැබිය යුතුයි. නමුත් ධ්‍යානගත ගැඹුරු මෙනෙහි කිරිමක් කරා අප ජිවිත මෙහෙයවන්නට මෙම සියලු කල්වාරි පුදබිම් කරා යොමු කරන අපගේ වන්දනා චාරිකා අපි සැබවින්ම පරිවර්තනය කර ගත යුතුයි. පුංචි ඔබ මේ පිළිබඳව මැනවින් සිතා බලන්න. මෙනෙහි කරන්න.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# සාධාරණත්වයේ මාවත කුරුසියේ පාදනමස්කාරය

## ජේසුස් වහන්සේට මරණීය දණ්ඩනය නියම කරනු ලබයි.

"ඔහු මරව , ඔහු මරව, ඔහු කුරුසියේ ඇණ ගසව" යි ඔවුහු මොර ගැසූහ. "ඔබේ රජු කුරුසියේ ඇණ ගසන්නට දැ"යි පිලාත් ඔවුන්ගෙන් ඇසීය. නායක පූජකයෝ පිළිතුරු දෙමින්, "සීසර් අධිරාජයා හැර අන් රජෙක් අපට නැතැ"යි කීහ. එකල ඔහු උන්වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලබන පිණිස ඔවුන්ට භාර දුන්නේය. (ජුවාම් 19:15-16) රාත්‍රියේදී ජේසුස්-වහන්සේ අල්ලාගත් සෙබළුන් එතුමා පිටතට ගෙන ගෙස් ඇඳුම් ඉවත්කර, නොයෙක් වද හිංසා පමුණුවා, කටු ඔටුන්නක් ද හිස පළඳවා අවසාන යේදී පිලාත් විසින් එතුමා කුරුසියේ මරණයට තීන්දු කරන ලදී. නමුත්.. එතුමාණන් කුරුසියේ මරණයට තීන්දු කළේ කුමක් නිසාද? මිනිසුන් "උන් වහන්සේ හැම දෙයම යස ලෙස කරන සේක, බිහිරන්ට ඇසීමද, ගොළුවන්ට බිණීම ද පවා සලසා දෙන සේක." යයි මොර නොදුන්නේද? (ශු. මාර්ක් 7:37)



ජේසුස් වහන්සේ දේව රාජ්‍යය සමීප බව පැවසූ සේක. එයින් අදහස් වුයේ ලෝකයේ සහ මිනිස් වර්ග යාගේ පූර්ණවූද, ස්ථිරවූද, නිදහස ඉතා ආසන්න බවයි. මෙය එතුමා සිදුකළ ප්‍රාතිහාර්යයන් තුළින් පැහැදිලිව දක්නට ලැබුණි. ජීවිතය, වරප්‍රසාදය, සාධාරණත්වය, ආදරය හා සාමය ලබාදෙන මෙම නිදහස ආරම්භ වන්නේ ධනවතා විසින් අසාධාරණ ලෙස සලකුණු ලබන දුප්පතුන් සමාජයේ කොන් කර දමා ඇති රෝගීන් හා ආගමික ලෙස පිටමං කරනු ලැබ ඇති පවුකාරයන් වැනි මෙම නිදහස ඉතාමත් අවැසි අය අතරින්ය. දෙවියන් වහන්සේ විසින් දනය කරන මෙම නිදහස ලබා ගැනීමට නම් මිනිසා තුළ සැබෑ සිත් හැරීමක් විය යුතු අතර, තමන් සිතන හා ක්‍රියා කරන අයුරුද වෙනස් විය යුතුමය. මෙම දේව රාජ්‍යය පිළිබඳ සුභාරංචිය එවන් සිත් හැරීමක් සිදුකරගත් අය සඳහා පමණක්ය. එසේ නොවන්නන්ට එය අශුභ ආරංචියක් පමණක් නොව, විනිශ්චයක්ද වනු ඇත. මෙය සුභාරංචිය වන්නේ සිත් හැරීම නිසා නපුර යහපත නමැති සත්‍යතාවය පරිවර්තනය වන බැවිනි. පාපය අසාධාරණත්වය හා මරණය ඇති කරන බාහිර හේතූන් ජය ගැනීමද මෙම සිත් හැරීමට අයත් වේ.

සිත් හැරීමකින් තොරව නිදහස ලැබෙන්නේවත් දේව රාජ්‍යය උදාවන්නේ නැත. එදා සමාජයේ තිබූ මිනිසුන් පෙළන ආගමික වත් පිළිවෙත් දේව කැමැත්තට එකඟ නොවන බව ජේසුස් වහන්සේ පෙන්වා දුන් සේක. සාධාරණත්වය සඳහා නඟන ඉල්ලීම් වලට අවධානය යොමු නොකරමින් මිනිසුන් හා මිනිස් අයිතිවාසි කම් ගරු නොකරමින් දෙවියන් නිදහසට කරුණක් ලෙස සලකා එදා සමාජයේ ජීවත්වූ භක්තිමත් මිනිසුන්ට විරුද්ධව එතුමා කථා කළ සේක. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළදෙවියන් වූයේ පව්කරුවන් නොමඟ ගිය බැටළුවා, අකීකරු පුත්‍රයා අත්නොහැර ආදර යෙන් පිළිගත් සදහනික යහපතේ පියාණන්ය. මෙම දෙවියන් වහන්සේට ඉතා ප්‍රසන්න වන්දනාව වන්නේ අනුන්ට සේවය කිරීමය. විශේෂයෙන් සමාජයේ ඉතාම පහත් වූවන් අබල දුබල වූවන් තුළ එතුමාණන් සැඟවී ඇති බැවින් ඒ අයට සේවය කිරීමය. ජේසුස් වහන්සේ එදා සමාජයේ වස්තුව දැනුම, බලය, තමන්ටම හිමිකරගෙන සිටි බලවතුන්ට විරුද්ධව කථා කළ සේක. එතුමා එම බලවතුන් සතුටු කිරීමට නොව දුප්පතුන්ගේ අදෝනාවලට සහනයක් නෙ ඒමට ඒ අය වෙනුවෙන් කථා කළ සේක. මේ සැම දෙයක්ම එදා සමාජයේ ජීවත් වූ වැඩිදෙනාට පහරක් වූ නිසා ඔවුහු එතුමා විනාශකර දැමීමට එකතු වූහ.

එතුමා මරණයට තීන්දු කිරීමට මූලික හෙතුව වූයේ එතුමා දේව අපහාස වචන කථා කිරීම යන චෝදනාවයි. ජේසුස් වහන්සේ තමන් දෙවියන් වහන්සේ ලෙස සළකා කථා කරන අයුරු , එදා ආගමික නායකයෝ දුටහ. එතුමන් කොන්කර දමා ප්‍රතික්ෂේප කර,බිය ගන්වා අවසානයේදී මරණ තීනිදුවට යටත් කළද, එතුමා තම නිදහස වෙනුවෙන් කිසිවක් කථා නොකළ සේක. පවු කරුවන් සහ මුළු ලෝකයේම පවු වෙනුවෙන් වන්දි ගෙවීමේ එතුමාගේ කාර්යයේදී තම සතුරන් මෙම නාටකයේ නළුවන් පමණක් බව එතුමා දැන සිටියේය. අවසාන වශයෙන් එතුමා මරණයට තීන්දු කිරීමට හේතුවුයේ මිනිසා තුළ මුල් බැස තිබූ පාපී භාවයත් ඔවුන් හදවත් තුළ තිබූ දැඩි බවත්. පිය සබඳතාවය නැතිවී තිබීමත්ය. තම අහිංසක හා නිදොස් බව සමගම මෙම මරණ තීනිදුව භාරගනිමින් එතුමා අප පාපයෙන් නිදහස් කළ සේක.

## සුදුතුම් පියතුමා



මගේ ආදර සුදුතුම් පියතුමෙනි, 2015 නව වසරක් උදා වෙද්දි අපි සැමටම අශිර්වාදයක් ලැබුණා. ඒවගේම සුදුතුම් පියතුමා අප රටට පැමිණීම ගැන අපි සැමට සතුටුයි. අපි ඔබට ගොඩාක් ආදරෙයි.

**ඈන් නිමලිනි**
04 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා විදුහල - මීගමුව

## උපන් දිනය

ජේසුනි මගේ උපන් දිනය පසුගියද සැමරුවෙමි. මා හට ඔබ වහන්සෙගේ ආශිර්වාදය නිබඳව දානය කළ මැනව. ඒ වාගේම මේ මොහොතේ මගේ දෙමාපියන් සිහි කරමි. ඔවුන් ආශිර්වාද කළ මැනව ආදර ජේසුනි.

**තරුෂි නෙත්මිණී**
03 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - ගාල්ල




## ශු. ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමනි...



ආදරයේ තුටු පඬුරක් වී
ලොව ජය නංවන ධජයක් වී
සැමටම සත සෙත උදා කෙරූ
ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමනි
සොයුරු පෙමේ රන් නෞකාවේ
නියමුවා වූ සාලෙස් මුනි තුමනි
දළුගම නම් වූ ග්‍රාමයේ
ආරක්ෂකයාණන් ඔබතුම වේ

**උදිනි අශේලිකා**
11 ශ්‍රේණිය
සා. ප්‍රැන්සිස් සාලෙස් දහම් පාසල - දළුගම

## සුන්දර සිරිලක

අතීත රජවරු රජකම් කළ සිරිලක
අභිමානවත් ඉතිහාසයක් හිමි සිරිලක
කාටද දෙවෙනි වෙන්නේ අපේ සිරිලක
සුරකිමු සෙනෙහසින් අප මව් සිරිලක

එක ලක් මෑණියන්ගේ දරු කැලක්සේ
සිංහ කොඩිය යට එකමුතු වෙමු සතොස්සේ
ගොඩ නගනෙමු ජාති, ආගම්, භේද නැතිලෙසේ
සමගියෙන් රැගෙන යමු රට නිදහසේ

**ඩේමියන් දෙව්මිණ**
05 ශ්‍රේණිය
ශා. බර්නදෙත් ආදර්ශ මහා විදුහල - පොල්ගහවෙල

**ආදර දුවේ පුතේ, ඔබගේ නිර්මාණ අප වෙත යොමු කරන්න. පිපෙන මල් යාය ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත කොළඹ 08**

## උද්‍යසනක මිහිරියාව



විහඟුන්ගේ ගී නාදය ඇසෙන්නා
ගිනි පැහැගත් හිරු ඈත දිස්වෙනා
සීත සුළං ගත දැවෙටෙන්නා
උද්‍යසනක මිහිරියාව ලොවට බෙදන්නා

සැම දෙස මල්පිපී සුවඳ වෑහෙනා
මින් රැළ දියෙහි නටමින් පීනන්නා
සුදු ඇඳගත් කොක්කු පෙළක් පාසල් යන්නා
උදෑනක මිහිරියාව ලොවට බෙදන්නා

**නෙත්සරී පෙරේරා**
09 ශ්‍රේණිය
ලොයොලා විදුහල - බෝපිටිය

## තාත්තා

මගේ තාත්තාගේ නම මරියන් ප්‍රනාන්දු. මගේ තාත්තා හරි හොඳයි.මට හොඳ නරක කියා දෙයි. මගේ තාත්තා හැම විටම මා ළඟ සිටියි. මගේ තාත්තාන රැක දෙන්න ජේසුනි.

**නේහා ප්‍රනාන්දු**
03 ශ්‍රේණිය
සා. ජෝශප් දහම් පාසල - ගම්පල



# බෝපිටිය ලොයලා විදුහලේ මාධ්‍ය ඒකකයෙන් සඟරාවක්




බෝපිටිය ලොයලා විදුහලේ මාධ්‍ය ඒකකය මගින් එළිදැක්වූ "ක්ෂිතිජ ප්‍රභා රශ්මිය" (Blazing Horizon) සඟරාවේ මංගල කලාපය ගැන සටහනක් තබනුයේ හදපිරි සතුටිනි. මෙහි ළමුන්ගේ නිර්මාණ සමගින් පාසලේ විවිධ අවස්ථාවන් හි සිදුවීම්, සේයා රූ සමගින් අන්තර්ගත කොට ඇත. සිංහල හා ඉංග්‍රීසි (භාෂා දෙකෙන්ම) නිර්මාණ පළකොට ඇති මෙහි පිටකවරය සිතුවමද "ක්ෂිතිජ ප්‍රභා රශ්මිය" සඟරාව තීව්‍ර කරයි. මෙය සිතුවම් කළ 11 ශ්‍රේණියේ ඩිලාන් අනුරාධ ජයසංඛ සිසුවාට අපේ සුබ පැතුම්!

හිටපු විදුහල්පති ගරු තිලකසිරි ප්‍රනාන්දු (පැ.තු.නි) පියතුමාගේ ඇරියුමකට අනුව මාධ්‍ය ඒකකයේ ළමුන් සඳහා නිර්මාණකරණය පිළිබඳව වැඩමුළුවකට එක්වීමට හා මෙහි අන්තර්ගත නිර්මාණයන් හොඳම නිර්මාණලෙස තෝරා දීමට දායක වීමට මට අවකාශ සැලසුණි. මොවුන්ගේ නිර්මාණකරන හැකියාවන් ප්‍රශස්ත මට්ටමක බැව් නොකියාම බැරිය. මෙම පළමු කලාපයේ සාර්තකත්වයට මග පෙන්වූ සංස්කාරක මණ්ඩලයේ සැමටත් මීට එක්වූ, දායක වූ සැමටත් සුබ පැතුම්!

මොවුන්ගේ නිර්මාණයන් මෙම සඟරාවට පමණක් සීමා නොවී වෙනත් පුවත්පත් සහ සඟරා සඳහාද නිර්මාණ යොමු කිරීමට වැඩ පිළිවෙලක් යෙදීම අනාගතයට ආයෝජනයකි. මොවුන් දිරිගන්වමින් මේ සඳහා ළමා ලේඛක ඔබට සහය දීමට "ළමා ප්‍රදීපය" අපි සැමවිටම සූදානම් බැව් සතුටින් යුතුව දන්වමු.

**කුමර නයනජිත්**

**ගරු ඉග්නේෂස් සේනානයක පියතුමන් විසින්**
**ළමා ප්‍රදීපයට ලියන නවතම විශේෂාංගය**
**ලබන සතියේ සිට..**

# අපි ආපසු හැරෙමු



අද සමහර ළමුන් උසස් සාමාන්‍ය පෙළ පාසල් වාර විභාග වලට අවුරුදු මාස ගණනාවකට පෙර ඉඳලා උදේ - රෑ නිදිවරාගෙන පාඩම් කරනවා. අමතර පංති - සම්මන්ත්‍රණ වලට යනවා. ඒ මදිවට පුංචි දුවලා පුතාලත් ඒ රැල්ලටම ඇදගෙන යනවා. මේ දවස්වල පාසල් නිවාසාන්තර මලල ක්‍රීඩාවලටත් දුවලා පුතාලා දුවන්න පනින්න පුරුදු පුහුණු වෙනවා. සරඹ ක්‍රීඩාවල යෙදෙනවා. ''වම - දකුණ'' ''සීරුවෙන් සිටින් - පහසුවෙන් සිටින්'' ''අවාර කරන්'' කියාගෙන ගමනේ යනවා. පාසලේ හෝ වෙනත් ප්‍රසංග සඳහා මාස ගණන් නටන්න, ගයන්න, වයන්න පුරුදු පුහුණු වනවා. ඒවාට ඇඳුම් පැළඳුම් සූදනම් කරනවා.

මේ සියල්ල දුවලා පුතාලා හරි උනන්දුවෙන් ආශාවෙන් කරනවා. නමුත් අපේ ජීවිතයේ කල්තියා එලෙසම සූදනම් වන්නෙ නැති එක් දෙයක් තියෙනවා. ඒ තමයි චතාරිකය සඳහා වන කාලය. ජේසුගේ උපන් දිනය මළවුන්ගෙන් උත්ථානවූ දිනය සතුටින් සමරන්නත් අපි කල්තියා සූදනම් වනවා. නමුත් උන්වහන්සේ දුකින්වේදනා විඳින කාලයේදී ඒ දුකට අපි සංවේදී වනවාමදියි කියා ඔබට හිතෙන්නෙ නැද්ද ? සමහරු ඒ දින 40 ක කාලයේදී ටොෆි චොකලට් වගේ පැණිරස දේවල් කටේවත් තියන්නේ නෑ කියලා හිත හදාගන්නවා.

නමුත් අමතක වෙලා හරි පුරුද්දට හරි කාලා '' කමක් නෑ එක දවසයිනේ'' නැත්තම් ''දවස්දෙකයිනේ කෑවේ'' කියලා නිදහසටත් කරුණු කියනවා. තවත් අය ''චතාරික කාලයේ එක දවසක්වත් වරද්දන්නේ නැතිව හවසට ජපමාලය කියනවායි'' කියලා තදින්ම පොරොන්දු වනවා. නමුත් ඉතිං ඒ වෙලාවට යන කාටුන් ටෙලි නාට්‍ය මතක් වෙනකොට එකත් කඩවුන පොරොන්දුවක්ම වනවා. මොනව කරන්නද නේද? ඒ ඔක්කොම කමක් නෑ කියමුකො - හැබැයි මේ සැරේ ඒ කියන්නේ 2015 දි ''අපි ආපසු හැරෙමු.'' දුවේ, පුතේ, අපි අවංක වෙමු. ජේසුගේ දුක් වේදනා අපේ කර පිටටත් ගනිමු. අපිත් ඒ සැම දෙයක්ම දරාගනිමු. අපේ පව් බර නිසා දුක්වින්ද ජේසු වෙනුවෙන් මෙවර අපේ පව්බර අඩුකරමු.

**සිරිල් පෙරේරා මාමා**

# අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව - 2015

**2008 වසරෙන් ආරම්භ වූ සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයේ අවසාන වර්ෂයට අපි එක් ව සිටිමු. මෙම වසරෙන් පසුව 2015 වර්ෂයේදී නව නිර්දේශයක් සමග අලුත්ම කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයකට මුහුණු දීමට අපට සිදුවේ. මෙම වසරේදී නව ආකාරයකට මෙම විභාගයට අපි සුදානම් වෙමු. තේමා කීහිපයක් ඔස්සේ අපි පුනරීක්ෂණයකට යෙදෙමු.**

**පසුගිය සතියෙන්.......**

**ඒකක අංක 01**
**විවිධ පුද්ගලයින්ගේ කියමන් ආශ්‍රිත ගැටලු :-**

20 "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි, යමෙකු වතුරෙන් ද ....... ද නුපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය" හිස්තැනට වඩාත් යෝග්‍ය පිළිතුර වන්නේ 2008/ 12

21 "මේ මාගේ පුත්‍රයාණෝ ය. මේ මා තෝරාගත් තැනැත්තාණෝය. මොහුට සවන් දෙන්න." මෙම ප්‍රකාශය හා සබැඳි සිද්ධිය වනුයේ 2008/14

22. ''සැරයටික්වත් , රොටිවත්, මිලමුදල්වත්, කමිස දෙකක් වත් නොගන්න''. මෙම ප්‍රකාශය අදාළ වන්නේ. 2008/16

23. ''ඔව්හු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගීකමෙහිද රොටී කැඩීමෙහිදී.......... ද නිරතව කල් ගත කළහ.'' ඉහත හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ 2008/24

24. ඔබ පූජාසනයේ පඬුරු පුදන විට ඔබේ සහෝදරයාට............යම්කිසි ............ ඇතිව සිටින බව එහි දී සිහිවී නම් පඬුරු පූජාසනය ඉදිරියේ තබා ගොස් පළමු කොට සහෝදරයා හා සමගි වී පඬුරු පුදන්න'' මෙහි හිස්තැන්වලට ඉතා යෝග්‍ය 2008/28

25. ''මිනිසා තනිව විසීමට සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක් මවා දෙන්නෙමියි'' වදාළ සේක. (උත් 2:18) මෙම කියමනින් අදහස් කළේ 2009/13

26. ''මනුෂ්‍ය පුත්‍රයාණෝ වැඩියේ සේවය ලැබීමට නොව සේවය කරන්නට බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා .....................ය'' හිස්තැනට යෙදන්නේ 2010/06

27. ''යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී'' මෙසේ පවසන ලද්දේ 2010/31

28. ''නුසුදුසු ලෙස ස්වාමින් වහන්සේගේ මේ රොටි වළඳන, මේ කුසලානෙන් පානය කරන කවරෙකු වුවද එසේ වැළඳීමෙන් හා පානය කිරීමෙන් ස්වාමින් වහන්සේගේ ශරීරයට හා රුධිරයට පව් කිරීමේ වරදකරුවෙක් වන්නේ ය'' යන ඉගැන්වීම සඳහන්වන ශුද්ධවූ පාවුළු තුමාගේ ලිපිය වන්නේ 2010/18

29. ''යමෙකු සතුරෙක්ද, ශුද්ධාත්මයාණන්ගෙන් ද, නැවත නුපන්නොත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැකිය'' යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ. 2010/19

30. ''මගේ අසල්වැසියා කවුද?'' යන පැනයට පිළිතුර වශයෙන් ජේසුස් වහන්සේ විසින් වදාළේ 2010/23

31. ''ස්වාමින් වහන්සේ ඔබ සමඟ ය'' යන වදන් පැවසුවේ 2011/05

32. ''ඔබ සියලු දෙනාම මනස්ථාපනය වී පව් කමාව ලබන පිණිස ජේසුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් දීමනා ලබන්නාහුය'' මෙම උපුටනයට පසුබිම වූයේ. 2011/21

33. ''ඔවුහු ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමේදී, සහභාගීකමෙහිද, රොටී කැඩීමෙහි ද............ නිරතව කල් ගත කළහ'' හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ 2011/33

34. ''ස්වාමිනි මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව'' මෙසේ යාච්ඤා කළේ. 2011/39

35. ජේසුස් වහන්සේගේ ධර්ම දූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ. 2009/05

**ඒකක අංක 01 යටතේ පළවූ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබන සතියේ**

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# මිතුරුකම



"කියාරා ඔයා අද වෙනද වගේ නෙමේ, හරි අමුතුයි. ඔයාට මුකුත් කරදරයක්ද?" මගේ හොඳම මිතුරිය කියාරාගේ මුහුණින් වෙනස හොඳ හැටි අවබෝධ කරගත් මම ඇගෙන් ඇසුවෙමි. "නෑ දිව්‍යා එහෙම මුකුත් නෑ" වෑයමෙන් සිනහවක් මුහුණට නංවා ගැනීමට අසාර්ථක වෑයමක් ගත් දිව්‍යා පැවසීය. "කියාරා මට ඔයාගේ වෙනස හොඳටම තේරෙනවා. ඇත්ත කියන්න මොක්කද ප්‍රශ්ණය.. ?" මම දිව්‍යාගෙන් යළිත් විමසුවෙමි. එවිට කියාරාගේ දෑසේ නැටු කඳුළු බිඳු දෙකක් ඇගේ දෙකම්මුල් තෙමමින් ගවුමට වැටී බොඳ විය. "දිව්‍යා මං දන්නවා ඔයා මාව හොඳටම තේරුම් අරගෙනයි ඉන්නේ කියලා. මේකයි ප්‍රශ්ණය, අපේ තාත්තා වැඩ කරන්නේ පිටරටනේ. අවුරුදු 3ක් එක දිගට වැඩ කරලා තාත්තා ඇවිත් මාස 3යි. ලබන සෙනසුරාදා තාත්තා ආපසු යනවා. මට ඒක දරාගන්න බෑ. ඒකයි මං කල්පනා කර කර හිටියේ. මේ කතාව ඇතිවුනේ පංතියේදී. එදා පංතිභාර ටීචර් ඇවිත් නෑ. එහෙම දාට වෙන ටීචර් කෙනෙක් නාවොත් ඔවුන් පංතියට වෙලා සිටීමයි සිරිත. "ඉතින් කියාරා තාත්තා යන්නේ ඔයාගේ දියුණුවටනේ. අනෙක ඔයාලාගේ අම්මා ඔයාටයි නංගිටයි කොච්චර ආදරේද? ඔයාලා දෙන්නා වෙනුවෙන් කොතරම් අම්මා වෙහෙසෙනවද? අනික තාත්තා ගිහින් ටික දවසකින් ඔයා සාමාන්‍ය තත්ත්වයට එවී..". "ඒකනම් ඇත්ත තමයි දිව්‍යා, ඒ වුනාට මේ සැරේ තාත්තා ආපු දවසේ ඉඳලා මං හිටියේ හරිම සන්තෝසෙන්. තාත්තා නැතිව අවුරුදු 3ක් හිටියේ කොහොමද කියලා හිතා ගන්නවත් බැරි තරම්.." "ඉතින් මේ ගැන තාත්තාට කිව්වද කියාරා." "නෑ දිව්‍යා මට එහෙම කියන්න හිතෙන්නේ නෑ. තාත්තා අපිට කොච්චර ආදරේද කියලා මං දැන් හොඳටම දන්නවා. අම්මයි, තාත්තායි දෙන්නත් ඉන්නේ හරිම සමාදානයෙන්. මං ලස්සනට අඳිනනවටත් තාත්තා හරි කැමතියි. මට රටින්ම ලස්සන ගවුම් හතර පහක්ම ගෙනල්ලා තියෙනවා. "ඉතින් කියාරා ඔයා මේ ගැන ඕනෑවට වඩා හිතලා කරදර වෙන්න එපා. දරුවන්ට ආදරේ තාත්තා කෙනෙක් හැටියට ඔයා ඔයාලාගේ තාත්තා ගැන සන්තෝෂ වෙන්න. තාත්තා ගියාට පස්සේ ඔයාටයි නංගිටයි අම්මාගේ ආදරය ලැබෙනකොට ඔය සාංකාව ඉබේම ඇරිලා යයි." දිව්‍යා කියාරාගේ හිත හැදෙන්න කියු දේවලින් පස්සේ කියාරාගේ දුක්මුසු ඉරියව්ව ටික ටික පහව ගිය බව දිව්‍යා තේරුම් ගත්තා. "දිව්‍යා ඔයා මගේ දුක තේරුම් අරගෙන මට කියපු දේවලින් මට සෑහෙන සහනයක් දැනුනා. ඔයා වගේ මිතුරියක් මට ඉන්න එක ගැන මං සන්තෝෂ වෙනවා. අපේ තාත්තා ආපසු යන්න ඉස්සෙල්ලා ඔයාලාගේ අම්මා තාත්තාට කියලා අපේ ගෙදර එන්නකෝ. ඔයාලගේ ගෙදර ඉඳලා අපේ ගෙදරට වැඩි ඈතකුත් නෑනේ." හොදයි කියාරා මං අම්මා තාත්තාට කියලා සෙනසුරාදා උදේ ඔයාගේ ගෙදර එන්නම්කෝ. "ඔන්න දිව්‍යා දවල් කෑමක් කාලා හවස යන්න බලාගෙනම එන්න. මං අම්මට කියලා ඔයාට රසට කන්න කැමති කෑමකුත් හදලා තියන්නම්කෝ." සෙනසුරාදා උදෑසනින්ම අවදි වූ කියාරා වෙනදා නැති උනන්දුවකින් මුහුණ කට සෝදාගෙන තාත්තා ගෙනැවිත් තිබූ ඇඳුමකින් සැරසුණාය. "කියාරා දුව යාලුවා පිළිගන්න තියෙන උනන්දුවක්.." තාත්තා කිව්වේ මුවගට සිනාහවක් නඟා ගනිමිනි. උදේ 10.00 වන විට දිව්‍යා දුර තියාම එනු දුටු කියාරා ඉදිරියට දිව ගියේ ඉහ වහ ගිය සතුටකිනි. කියාරාගේ අම්මා තාත්තාද දිව්‍යා ආදරෙන් පිළිගත්හ. එදා කියාරාට හරිම සතුටු දවසකි. දවල් කෑමට අම්මා ව්‍යාංජන කිහිපයක්ම සාදා තියුණි. දිව්‍යා කෑමට කැමති කජු මාළුවක් ද මගේ කීම මත සාදා තිබුණි. අම්මාත් තාත්තාත්, දිව්‍යාත් මාත් නංගීත් වෙනදාට වඩා වැඩි ආසාවකින් කෑම කෑවෙමු. "අංකල් දැන් ඔයා රට ගියාම කියාරාට දුක හිතෙයිද දන්නේ නෑ.." දිව්‍යා කෑම කන අතර ප්‍රශ්ණයක් දැම්මාය. "නෑ දුව මං මේ සැරේ දිගටම ඉන්නේ නෑ. අවුරුද්දෙන් අවුරුද්ද එනවා. අනික මං ඉන්ටර්නෙට් එකෙනුත් නිතර හැමෝටම කතා කරනවානේ. එතකොට මේ ගොල්ලන්ට දුකක් දැනෙන එකක් නෑ." දිව්‍යා කියාරාගේ අත මිරිකුවේ සතුටිනි. එදා සවස ගෙදර ගියේ පුදුම සතුටකිනි.

සී.ආර්. ඩික්සන් ඇන්ටනි.

# චතාරික භ



ශ්‍රී කුරුසියේ වන්දනාව

## Ecce Homo



''මෙන්න මනුෂ්‍යා'' ජේසු සමිඳුන් පිලාත්ගේ රජවාසලේදී රතු ජගලාත්තුව ඇඳ, කටු ඔටුන්නක්ද, බට දණ්ඩක්ද අතින් ගෙන ජනතාව ඉදිරියට යාම අරභයා මෙම භක්ති අභ්‍යාසය ආරම්භ වී තිබේ. අදත් දුව, පිටිපන, ජා-ඇල වැනි පෙදෙස් වල පාස්කු නාට්‍ය අරභයා මෙකී බැතිය සිදු කෙරේ. ඒ සඳහා වෙනම ප්‍රතිමාවක්ද සාදා ඇත.

චතාරික සමය තුළ ප්‍රබලව ඉස්මතු කෙරෙන ගැඹුරු දේවධාර්මික සලකුණකි. මෙය 4 වන සියවසේදී හෙලේනා අගරැජින ජෙරුසලමේදී ශු. කුරුසිය සොයාගැනීමත් සමග මෙකී බැතිය ආරම්භ වූ බව විශ්වාස කෙරේ. චතාරිකය තුළ ශ්‍රී කුරුසිය ජනවන්දනා පිළිවෙත් තුළට එක්වී ශ්‍රී කුරුසියේ නිරාවරණය, සිපාචාරයද ශ්‍රී කුරුසියේ වන්දනාව ලෙස සුවිශේෂි පිළිවෙත් සමූහයක් දක්නට ලැබේ.

## පාද නමස්කාරය



චතාරිකයේ අප දන්නා සුපතල මෙන්ම ජනප්‍රිය භක්ති අභ්‍යාසය මෙයයි. මුල් සියවස්වල සිටම ජේසු සමිඳුන්ගේ දුක් ප්‍රාප්තියට බැදි සිද්ධින් හා ස්ථාන කිතුනුවෝ වන්දනාවට ලක් කළ බව ඉතිහාසයේ කියවේ. 4 වන සිය සේ ශු කුරුසියේ ධාතු රෝමයට රැගෙන ආ පසු ඒ සඳහා වෙනම බැසිලිකාවක් සාදා මහා සිකුරාදා දින සුදුතුම් පියතුමාන් පාවහන් රහිතව ලතරානු බැසිලිකාවේ සිට එම බැසිලිකාව දක්වා ගමන් කළ බවත් සඳහන් වේ. අද අපට හමුවන පාදනමස්කාරය 18 වන සියවසේදී සභා අනුමැතිය ලද එකකි. එහෙත් 1975 දී vi වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා අලුතින් පාදනමස්කාර ස්ථාන 15 ක් නිර්දේශ කර ඇත.



## ශ්‍රී වණ කැළල්

කිතු සමිඳුන්ගේ ශ්‍රී වණ කැළැල් අරභයා විහිඳී ඇති මෙම භක්තිය පාස්කු කුරුස ප්‍රතිමාවන් පාදක කරගෙන අදත් විහිදී ඇත. මෙහිදී ශ්‍රී වණ කැළැල් සෝදා පවිත්‍ර කොට එම ජලය රෝගීන් උදෙසා රැගෙන යනුද දක්නට ලැබේ. තවද ඊට සම්බන්ධ වෙනම යැදුම් නුවාන සම්ප්‍රදායක්ද පවතී.

## නිරාහාරය හා උපවාසය

චතාරිකය තුළ කිතුනුවන්ට උපවාසය හා නිරාහාරය අනිවාර්ය අංගයක් සේ දැකිය හැක. මෙහිදී දේව වචනයේ සඳහන් (ද්.වි 8/3) (මතෙව් 4/4) (ලුක්4/4) සමග විහිදී ඇති දේව ධාර්මික පදනමක් මේ සඳහා පවතී.

## කටු ඔටුන්න, ඇණ, හෙල්ලය



කිතු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය අරබයා විහිඳි ඇති මෙම භක්ති අභ්‍යාසය තුළ දුක්ප්‍රාප්තියේ ගෞරවයේ සලකුණු වන මේවාට බැති පුද සිදු කෙරේ. මේවා ආසිරි ගැන්වීම හිසමත තබා යාච්ඤා කිරීමද දක්නට ලැබේ.

# ක්ති අභ්‍යාස

### වික්ෂෝප ස්ථාන බැතිය හෙවත් වික්ෂෝප ධ්‍යානය

16 වන සියවසේදී විශේෂයෙන් මයිකල් ආන්ජලෝගේ පියෙටා නම් කිරිගරුඬ පිළිරුව මෙයට විශාල දායකත්වයක් දරා ඇත. කිතු සමිඳුන්ගේ ශ්‍රී දේහය උකුලේ හොවා ගෙන සිටින මරිය මවුන් නිරූපණය කෙරෙන අතර විශේෂයෙන් චතාරිකයේ අවසාන සිකුරාදා දින මේ බැතිය සිදුකෙරේ.





### ශ්‍රී දේහය රැගත් පෙරහැර

එංගලන්තයේ අපට උරුම වූ මෙම බැතිය කිතු සමිඳුන්ගේ ශ්‍රී දේහය ශ්‍රී ගල්ලෙනහි තැම්පත් කිරීම මෙමගින් ගම්‍ය වේ. ඉටිපහන් දල්වාගෙන ශ්‍රී දේහය යහනාවක් මත සතපවාගෙන ගැඹුරු නිහැඬියාව තුළ මෙම භක්ති අභ්‍යාසය සිදුකෙරේ.



### ගොබ් කොළ ආසිරි ගැන්වීම හා පෙරහැර

චතාරික සමයේ ඉතා සුවිශේෂි තවත් භක්ති අභ්‍යාසයක් වන මේ තුළින් විශ්ව රජාණන් වන කිතු සමිඳුන් හට යටහත් පහත්වීම හා සාක්ෂි දැරීමට අප සැම කැඳවාලයි. මෙය ගොබ් ඉරුදින පමණක් සිදු කෙරේ.



### ශ්‍රී ගල්ලෙන

මෙයද එංගලන්තය , ස්පාඤ්ඤය හරහා ජන වන්දනා භක්ති අභ්‍යාසයට එක්වී ඇත. නූතනයේදි මහ සිකුරාදා දින මධ්‍යම රාත්‍රිය තෙක් විහිදි ඇති මෙම බැතිය තුළ ජේසු සමිඳුන්ගේ මිනිසත් බව ඉතා ප්‍රබලව ඉස්මතු කෙරේ. ලංකාවේ බොහෝ දෙව් මැදුරු වල මෙම බැතිය සිදු කෙරේ.

### පසම් හා ලතෝනි

දුක්ප්‍රාප්තිය ගායන ලෙස සැලකෙන පසම් තුළින් ද ලතෝනි හෙවත් දේවමාතාවන්ගේ විලාප ගායනා මෙම භක්ති අභ්‍යාසයට අයත්ය. රාත්‍රියේ ගෙමිදුලේ ඒකරාශී වී විශේෂයෙන් සිකුරාදා දිනවල චතාරික සමය පුරාවට මේ බැතිය නොකැඩී පවති.





අසේල දසනායක

### පසුපිටේ කතාව .......

## ළ.ක්‍රි.වී සෞන්දර්ය උළෙල

ශ්‍රී ලංකා ළමා ක්‍රියාකාරී වීරයෝ ව්‍යාපාරයේ 2014 - 2015 වසර සෞන්දර්ය වසර ලෙස නම් කර එයට සමගාමීව කුසලතා ඇගයීම් මාලාවක් සංවිධානය කර තිබුණි. එහිදී ගායන, වාදන, චිත්‍ර , නාට්‍ය , නර්තන හා ජායාරූපකරණය ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ කුසලතා ඇගයීම් දිසා, පදවි මට්ටමින් පවත්වා 2015.01.03 දින ජාතික කුසලතා ඇගයීම් මාලාව මරදන ශාන්ත ජෝශප් විද්‍යාලයේදී ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ පැවැත්වීය. එහිදී ජයග්‍රහණය ලැබූ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ගේ ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදනය කිරීම හා ඔවුන්ගේ ජයග්‍රාහී අංග වේදිකා ගත කිරීම 2015.02.07 දින මීගමුව ලොයලා විද්‍යාලයීය ශ්‍රවනාගාරයේදී උත්සවශ්‍රීයෙන් පැවැත්වීය. මෙම සෞන්දර්ය උළෙලට ළමා රංගන ශිල්පී ප්‍රමුදිත උදයකුමාර පුංචි පුතණුවන් විශේෂ ආරාධිත අමුත්තා ලෙස අප සමඟ එක්විය. මුළු දිවයිනම ආවරණය කරමින් සිංහල හා දමිළ ළමුන් 750 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගී වූ අතර නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශාධිපති අතිගරු රොහාන් සිල්වා පියතුමන් ඇතුළු සර්ව ආගමික නායකයින් ද අප හා එක් විය.

**ළ.ක්‍රි.වී. ජාතික අධ්‍යාපන කමිටු සභාපතිනි**
**ධනුෂ්කා සුභාෂිණී**

## ඔබ දන්නවාද?

01. ලොව ප්‍රථම ජංගම දුරකථනය නිෂ්පාදනය කළ කණ්ඩායමේ නායකයා වුයේ කවිද? **මාටින් කූපර්**

02. ස්ටෙතස්කෝපය නිපදවන ලද්දේ කුමන වෛද්‍යවරයාද? **රෙනී ලෙනන්**

03. ආහාරටින් කර කල්තබා ගැනීමේ ක්‍රමය නිර්මාණය කරන ලද්දේ කවර අධිරාජ්‍යාගේ කාලයේද? **නැපෝලියන් බොනපාට්**

04. 1848 කැරැල්ල සමයේ ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය පාලකයා කව්ද? **වික්ටෝරියා රැජිණ**

05. එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ පුරෝගාමියා වුයේ කව්ද? **ප්‍රැන්ක්ලින් රූස්වෙල්ට්**

06. ප්‍රථමවරට ගිනිකූර සොයාගත් තැනැත්තා වන්නේ කව්ද? **කාලි ලුග්ස්ඩ් ස්ට්‍රොන්**

**මැක්සිමස් රෝයි පෙරේරා මාමා**

## නෙළුම්ගේ සිහිනය

''ඊයේ රාත්‍රියේ නොනවත්වා ඇද හැලුණු මහ වරුෂාව නිසා මුළු මිදුලම වතුරෙන් පිරිලා හරියට ගඟක් වගේ. දිය බුබුළු හදන වතුර දැකපු ගමන් මල්ලී වතුර පාර පාගන්න වතුරට පනින්න හැදුවා. අම්මා ඉක්මනට මල්ලිව අල්ල ගත්තා. මම මල්ලී දිහා බලලා කට කොනකින් හිනා වුණේ හොඳ වැඩේකියන්න වගේ මල්ලී මා දිහා තරහින් බලා අඬන්න පටන් ගත්තා. වතුර පාගපුවහම ලෙඩ හැදෙනව කියලා චූටි මල්ලිට තේරෙන්නේ නැහැ. එතකොට අම්මට කිරි කපන්න යන්න වෙන්නේ නැහැ. එදාට අපිට බඩගින්නේ තමයි ඉන්න වෙන්නේ. ආණුඩුවේ ඉස්පිරිතාලෙකට ගියත් නැති බෙහෙත් ගන්න වෙන්නේ පිටින්නේ අනේ චූටි මල්ලිට මේ දේවල් තේරුණානම්

''ලොකු දුවේ, ඉස්කෝලේ යන්න ලෑස්ති වෙන්න. '' අම්මගේ කටහඬින් මගේ සිතට ගලා ආපු සිතුවිලි වලින් අවදි වුණා. ''ඔහොම ඉදලා හරියන්නේ නැහැ. මට වැඩට යන්න පරක්කු වෙනවා. '' කියලා අම්මා කෑ ගැහැව්වා. අම්මා ඉක්මනට මල්ලිව ලෑස්ති කරගත්තා. අම්මා උදේ පාන්දර නැගිටලා හදලා දීපු රොටියත් ඔතාගෙන කෑම පෙට්ටියට දාගත්තා. අම්මා මල්ලිව වඩාගෙන ඉස්සර වෙලා ගියා. ''පාරෙත් වතුර ඇති දුවේ. සෙරප්පු දෙක අතට ගන්න මඩ විසිවෙයි.'' අම්මා එහෙම කියනකොටත් මගේ ගවුමට තිත් තිත් මඩ පහරවල් වැටිලා ඉවරයි. ''දැන් ඉතින් මොනවා කරන්නද ඔහේ යනවා.'' මටම කියා ගත්තා. මං බලාගෙන හිටියා මල්ලී අම්මාගේ ඇගේ දැවටි දැවටි ඉන්නවා.

''අනේ අපේ තාත්තා නැතිවුණු කරුමෙට අම්මා දුක්වෙනවා.'' මට ඉබේටම හිතුනා. තාත්තා හිටියානම් අපට මෙහෙම දුක් විදින්න වෙන්නේ නැහැ. තාත්තා ඒ කාලේ රබර් වත්තේ මුරකාරයාලු තාත්තාට රබර් වත්තේදී පොළගෙක් ගහලාලු මැරුණේ. මට එතකොට අවු. පහක් විතර ඇති. මට යාන්තම් මතකයේ රැදිලා තියනවා ඒ සිද්ධිය. මල්ලීට යන්තමින් මාස දෙකයිලු. ඒ කාලේ ගමටම තිබ්බේ ගුණපාල මාමාගේ අත්ට්‍රැක්ටරය විතරයිලු. ගුණපාල මාමාගේ ට්‍රැක්ටරයේ තියාගෙන යද්දී මගදීම තාත්තා මැරිලලු. හැමදාම අම්මා ඔය ගැන කිය කියා හුල්ලනවා.

අම්මාගේ කරදර අහවර වෙන්න නම් මම හොඳට ඉගෙන ගන්න ඕනේ. මම කවදහරි ලොකු ඉස්කෝලේ නෝනා කෙනෙක් වෙනවා කියලා මම හිතාගත්තා. එතකොට අම්මවයි මල්ලිවයි මට බලාගන්න පුලුවන්. මල් වැටුණු සාරියක් ඇදගෙන උගන්වන හැටි මට මැවිලා පේනවා. එතකොට මේ ගුරුපාර පාරක් වෙලා තියේවි. වැස්සට වලවල් හැදෙන අපේ මිදුල මම හොඳට හදලා මල් හිටවනවා. එතකොට මල්ලිට උජාරුවෙන් මිදුලේ ඇවිදින්නත් පුලුවන්. අම්මා එතකොට රබර් කපන්නේ නැතුව මම එනතුරු බලා ඉන්න පුළුවන්. ''මොකද නෙළුම් ඉස්කෝලේ එන්න පරක්කු වුනේ?'' ලොකු ඉස්කෝලේ මහත්තයා කෑගහනකොට තමයි මම පියවි ලෝකයට ආවේ. මම මුකුත් නොකියම පන්තිය ඇතුලට රිංග ගත්තා. පන්තියේ ඔක්කෝම ළමයි මට හිනා වුණා. ඒ හිනාවුණේ ලොකු ඉස්කෝලේ මහත්තයා මට බැනපු හින්දද, නැත්නම් මගේ ගවුමේ මඩ පැල්ලම් දැකලද කියලා මට හිතාගන්න බැරි වුණා.

**නෙත්සරී පෙරේරා** - 08 ශ්‍රේණිය
ලොයලා විදුහල - බෝපිටිය
(උපුටා ගැනිම - ''ක්ෂිතිජ ප්‍රභා රශ්මිය'' සඟරාවෙනි)

# ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු පදවි (1886-2015)

## 07 බදුල්ල රදගුරු පදවිය (1972.12.18)

මහනුවර රදගුරු පදවියෙන් ඌව පළාත වෙන්කර, 1972 දෙසැම්බර් මස 18වන දින, බදුල්ල රදගුරු පදවිය ස්ථාපිත කෙරිණි.



**ප්‍රථම රදගුරු හිමි :**
**අති උතුම් ලියෝ නානායක්කාර (සා.බෙ.නි) හිමිපාණෝ**

**සෙසු රදගුරු හිමිපාණෝ :**
අති උතුම් එඩ්මන්ඩ් ප්‍රනාන්දු (නි.ම.නි.) හිමිපාණෝ

**ආසන දෙව්මැඳුර :**
**බදුල්ල ශු. ජපමාල දේව මාතාවන්ගේ ආසන දෙව්මැඳුර**

**වත්මන් රදගුරු හිමි :**
**අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු (දි.ස.නි) හිමිපාණෝ**

## 08 මන්නාරම රදගුරු පදවිය (1981.01.24)

මන්නාරම රදගුරු පදවිය, 1981 ජනවාරි මස 24වන දින, ස්ථාපිත කරන ලදි. යාපනය රදගුරු පදවියට අයත් ව තිබූ, මන්නාරම හා වව්නියා දිස්ත්‍රික්ක, එයට අයත් විය.



**ප්‍රථම රදගුරු හිමි :**
**අති උතුම් තෝමස් සෞන්ද්‍රනායගම් හිමිපාණෝ**

**ආසන දෙව්මැඳුර :**
**මන්නාරම සාන්ත සෙබස්තියන් ආසන දෙව්මැඳුර**

**වත්මන් රදගුරු හිමි :**
**අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණෝ**

## 09 කුරුණෑගල රදගුරු පදවිය (1987.05.15)

කුරුණෑගල රදගුරු පදවියට අයත් භූමි ප්‍රදේශය, 1847 සිට 1887 දක්වා අවුරුදු 40ක් උතුරු (යාපනය) අපෝස්තලික අනු පදවියට ද, 1887 සිට 1893 දක්වා අවුරුදු 06ක් යාපනය රදගුරු පදවියට ද, 1893 සිට 1939 දක්වා අවුරුදු 36ක් කොළඹ අගරදගුරු පදවියට ද, 1939 සිට 1987 දක්වා අවුරුදු 48ක් හලාවත රදගුරු පදවියට ද අයත් ව තිබිණි.

කුරුණෑගල දිස්ත්‍රික්කය, හලාවත පදවියෙන් වෙන්කර, 1987 මැයි මස 15වන දින, කුරුණෑගල රදගුරු පදවිය ස්ථාපිත කරනු ලැබිණි. කුරුණෑගල රදගුරු පදවිය බිහි කිරීමෙහි ලා දූරදර්ශී තීරණයට එළැඹ, එය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළෝ, හලාවත රදගුරු පදවියේ දෙවන එඬේරාණන් වූ, අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමිපාණෝ ය. කුරුණෑගල රදගුරු පදවිය, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයට සීමා වේ.



**ප්‍රථම රදගුරු හිමි :**
**අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණෝ**

**විශ්‍රාමික රදගුරු හිමිපාණෝ :**
අති උතුම් රේමන්ඩ් පීරිස් හිහිපාණෝ

**ආසන දෙව්මැඳුර :**
**කුරුණෑගල සාන්ත ආනා ආසන දෙව්මැඳුර**

**වත්මන් රදගුරු හිමි :**
**අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ**

### නිවැරදි කිරීමයි

**පසුගිය සතියේ පළවූ ත්‍රිකුණාමලය රදගුරු අති උතුම් කිංස්ලි ස්වාම්පිල්ලේ හිමිපාණන්ගේ සේයාරුව වෙනුවට යාපනය රදගුරු හිමිපාණන්ගේ සේයාරුව පළවුයේ ප්‍රමාදදෝෂයකින් බව කරුණාවෙන් සලකන්න.**

**සංස්කාරක පියතුමා**



**ත්‍රිකුණාමලය රදගුරු**
**අති උතුම් කිංස්ලි ස්වාම්පිල්ලේ හිමිපාණෝ**

**ඉදිරියට........**

**ගරු ජුඩ් දසනායක පියතුමා - කුරුණෑගල පදවිය**



## ආදර දේව අම්මා
**නිම්ෂි සඳර්ශනා**
11 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - නිට්ටඹුව

## කතෝලික ධජය
**ජනුද සෙහාන්**
06 ශ්‍රේණිය
සා. පීතර විදුහල - කොළඹ 05





## අපේ දහම් පාසල් ගුරුවරිය
**ගයනි ජයමාලි**
04 ශ්‍රේණිය
ශා. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසල
කැකිරාව




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## උදැසන අසිරිය නරඹමු
**නිපුනි ප්‍රබෝධා සිල්වා**
07 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ



## අලි පැටියෙක්
**ෂේලා සෙනෙත්මා**
07 ශ්‍රේණිය
සා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල - හලාවත



## මොස්තරයක්
**සුචිත දිස්මික**
ළදරු ජේසු
පෙර පාසල
පේරලන්ද



# ශු. ඉරනේයස් මුනිතුමා

ක්‍රි.ව. 130-140 පමණ කාලයේ දී සුළු ආසියාවේ ස්මිර්ණා නුවර උපත ලද බවට සැලකිය හැකිය. මව්පියන් ගැන හෝ කුඩා කාලයේ ආගමික ජීවිතය ගැන හෝ එතරම් යමක් කිව නොහැක. කෙසේ වෙතත් කුඩා අවදියේ සිට පොලිකාප් තුමාගේ ඇසුර ලැබූ බවට නම් සාක්ෂි ඇත. එව්සේබියස් තුමාට අනුව ඉරනේයස් තුමා විසින් ෆ්ලොරිනස් තුමාට ලියන ලද ලිපියෙහි සඳහනකට අනුව ඉරනේයස් තුමා පොලිකාප් තුමාගේ දේශනාවලට සවන්දී ඇත.

ක්‍රි.ව. 170 දී ප්‍රංශයට පදිංචිය සඳහා ගිය මෙතුමා පසුකලක ලියෝන්ස් නුවර රදගුරු තනතුරට පත්වූ බවට ඉතිහාසයේ දැක්වේ. ක්‍රි.ව. 177 දී පොන්තිනස් මුනිතුමා ලියෝන්ස් නුවර රදගුරු ලෙස කටයුතු කළ කාලයේ ඉරනේයස් තුමා පූජක තුමකු ලෙස සිටි බව ඉතිහාසය සඳහන් කරයි. මේ කාලයේදී එතුමා කෙල්ටික්වරුන් අතර ක්‍රිස්තුධර්මය ප්‍රචාරය කිරීමට හා සභා සමගිය හා සාමය ඇති කිරීමට මහත් උත්සාහයක් දරා ඇත. පාස්කු දිනය පිළිබඳව සුළු ආසියාවේ රදගුරු වරුන් හා රෝම රදගුරුවරයා අතර ඇතිවූ ආරාවුලක් සමතයට පත් කළේ අයිරේනියස් තුමාය. නොස්ටික් වාදය, ජුදෙව් වාදය හා ග්‍රීක දර්ශන වාදය යන විවිධ මත වාදවලින් ක්‍රිස්තු ධර්මය ආරක්ෂා කර ගැනීමට අයිරේනියස් තුමාගෙන් වූ සේවය අතිමහත්ය.




අයිරේනියස්ගේ පොත්වලින් අදට ඉතිරිව ඇත්තේ පොත් දෙකක් පමණයි. එකක් නොස්ටික් වාදයට විරුද්ධව ලියූ පොතකි. අනික අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ ලියන ලද ග්‍රන්ථයකි. නොස්ටික් වාදයට විරුද්ධව ලියන ලද ග්‍රන්ථයේ කාණ්ඩ පහකි. ග්‍රීක භාෂාවෙන් මෙහි මුල් පිටපත ලියා ඇත. නමුත් ඒවා විනාශවී ඇති බැවින් අඩංගු කරුණු ගැන යමක් කිව නොහැක. ලතින් පරිවර්තනයකින් කළ කාණ්ඩයක් හා අර්මේනියානු පරිවර්තනයකින් කළ කාණ්ඩයක්ද ඉතිරිව ඇත. මේනිසා මෙම ග්‍රන්ථයේ අඩංගු කරුණු බොහෝමයක් දැනගත හැකිවී ඇත්තේ ලතින් පරිවර්තනයෙනි.

ඔහු විසින් ලියනලද ප්‍රධාන කෘතිය වන මෙම ග්‍රන්ථය ලියා ඇත්තේ නොස්ටික් වාදී මත ඉදිරිපත් කළ ''වැලන්ටීනස්'' හා ''මොන්ටේනස්'' යන අයගේ මිත්‍යා මත ප්‍රතික්ෂේප කිරීම සඳහාය. මෙහි පළමු කොටස ඥානවාදීන්ගේ ඉගන්වීම් වල අසත්‍යභාවය ගැන කතාකරයි. දෙවන කොටස දර්ශනවාදය පදනම් කරගෙන මෙම දුර්මත ගැන කරුණු ඉදිරිපත් කරන අතර ඒවා සභාවේ ධර්මයට පටහැනි වන්නේ කෙසේද යන්න ගැන විස්තර කරයි. අනෙක් කොටස් තුන සභා සම්ප්‍රදායන් හා ශුද්ධවූ ලියවිල්ල පදනම් කරගෙන සභාවේ නියම ධර්මය ගැන කතා කරයි. අවසන් වශයෙන් ඥානවාදීන්ගේ ඉගන්වීම් ප්‍රතික්ෂේප කරමින් තර්කානුකූලව ඒවා බිඳ දැමීමට ඉරනේයස් තුමා උත්සහ දරා ඇත. මෙලෙස අවසන් කොටස් තුන තුළ කතෝලික විශ්වාසයේ පදනම ගැන කතා කරයි. ''අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම්'' යන කෘතිය ඔහුගේ දෙවන කෘතියයි. ඔහු මෙහිදී බයිබලය පදනම් කරගෙන දෙවියන් වහන්සේ තමන්වහන් සේවම දීර්ඝ කාලයක් ඔස්සේ මිනිසාට එළිදරව් කරමින් මිනිසා සමග කිට්ටු සම්බන්ධයක් පවත්වා ගෙන ගොස් අන්තිමේදී



ක්‍රිස්තුන් වහන්සේ තුළ උන්වහන්සේගේ නියම ක්‍රියාකාරිත්වය හා නියම ස්වභාවය අනාවරණය කළ ආකාරය බයිබලය ආශ්‍රයෙන්ම පෙන්වා දෙයි. ඔහු ජොහාන් සුබ වදනේ සඳහන් පෙර වදන අනුව ක්‍රිස්තුන් වහන්සේ ලෝගොස් හෙවත් දෙවියන් වහන්සේගේ වචනය බවත් උන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රේමය බවත් ක්‍රිස්තුන් වහනසේ දෙවන ආදම් බවත් ප්‍රකාශ කළේය. එමෙන්ම මාංශවත් ක්‍රිස්තුන් වහන්සේ පූර්ණ මිනිසෙක් බව කියමින් සුභාරංචි සතරේ ඇති උත්තරීතර බවට මුල් තැන දියයුතු බව තරයේ කියාපායි.

සත්‍ය පැහැදිලි කිරීමේදී නිතරම අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් අනුව එය සිදුවිය යුතු බව කියන ඉරනේයස් තුමා ක්‍රිස්තු සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බවද පවසයි. එබැවින් එම ශරීරයේ පැවැත්ම ශුද්ධවූ ලියවිලි අනුව වියයුතු බවද ඉරනේයස් තුමා පැවසුවේය. ඉරනේයස්ගේ දේව ධර්මයේ මූලික තැනක් ක්‍රිස්තුන් වහන්සේට හිමිවේ. මැවිල්ලේ මූලිකයා හෙවත් ප්‍රථම මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේ බව කියන මෙතුමා මිනිසාගේ විමුක්තිය සඳහා උන්වහන්සේ මිනිසත් බව ගෙන ලොව පහළවූ බවත් මේනිසා ක්‍රිස්තුන් වහන්සේ නව මිනිසා හා නව ආදම් බවත් පවසයි. ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යය මගින් ඇතිවූ සාතන්ගේ පරාජය මානව විමුක්ති ඉතිහාසය තුළ සිදුවූ සාතන්ගේ ප්‍රධානම පරාජය බව එතුමා පෙන්වාදෙයි. නමුත් මේ පරාජයෙන් අත්වූ ජය නැතහොත් ගැලවීම යමෙකු හිමිකරගත හැක්කේ ක්‍රිස්තුන් වහන්සේ විසින් පිහිටුවන ලද උන්වහන්සේගේම ශරීරය වන ක්‍රිස්තියානි සභාව තුළින් පමණක් බවද ඔහු පවසයි. දේව ධර්මය තුළ ක්‍රිස්තු භක්තිකයා රැඳී සිටිය යුතුය යන මතය ඉරනේයස් තරයේ විශ්වාස කළේය. ඒ සඳහා අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම මත කිතුනුවා රැඳී සිටිය යුතු බව ඔහු අවධාරණය කළේය. කිතුනු ජීවිතයේ මූලික අරමුණ දෙවියන්ට සම්බන්ධවීම නැතහොත් දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයක් බවට පත්වීම යැයි ඔහු ප්‍රකාශ කළේය.

පූජකැඩීමේදී හෙවත් ශුද්ධ සහභාගිකමේදී යොදාගන්නා පූජවල ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩවසනබව ඔහු කියා සිටියේය. ඔහුගේ දේවධර්මය තුළ කැපී පෙනෙන සාධකයක් නම් එතුමා නිතරම ශුද්ධ ලියවිලි පාඨ ඇසුරෙන් වාග් මාලාව හැසුරවූ බවයි. ඔහු ක්‍රිස්තු කේන්ද්‍රීය දර්ශනයකින් පුරාණ ගිවිසුම දෙස බලන අතර මැවිල්ලට පෙරත් ක්‍රිස්තුන් වහන්සේ සිටි බව අනාවරණය කිරීමට උත්සහ දරයි. ඔහුගේ දේව ධර්මය බයිබලය හා සභාවේ ඉගැන්වීම් මත පදනම් වී ඇත. එබැවින් සභා මාතාව ඔහු ශ්‍රේෂ්ඨ දේව ධර්මාචාර්ය වරයකු ලෙස සලකයි. නොස්ටික් වාදය, ජුදෙව් වාදය හා ග්‍රීක දර්ශන වාදය යන විවිධ මත වාදවලින් ක්‍රිස්තු ධර්මය ආරක්ෂා කර ගැනීමට අයිරේනියස් තුමාගෙන් වූ සේවය අතිමහත්ය. මෙතුමා ක්‍රි.ව. 202 දී වේද සාක්ෂිවරයෙකු ලෙස දිවි පිදුබව කියවේ.

**අසේල දසනායක**


එයින් පසු.. තම ඊශ්‍රායෙල් ජනතාවට අවසන් වරට ආශිර්වාද කළ මෝසෙස් තුමා...
සැකසුම දෙබස් චිත්‍ර: පාලිත සුදුආරච්චි
මෝසෙස් 83
මිනිසුනේ දෙවියන් වහන්සේ විශ්වාස කරපල්ලා..! මා නුඹලාට කිය.. සෑම දෙයක්ම පිළිපදිපල්ලා. එවිට මේ ගඟෙන් එතෙරදී දෙවියන් වහන්සේ පොරොන්දුවූ දේශය නුඹලාට සම්භාවේවි.. එහි නුඹලාට බොහෝ කාලයක් වාසය කරන්ට හැකිවේවි...
මේ දෙවියන් වහන්සේගේ කැඳවීම.. මා දැන් යා යුතුයි...
එසේ පවසා මෝසෙස් තුමා දෙවියන් වහන්සේගේ අණ පරිදි.. තම ඊශ්‍රායෙල් ජාතිකයින්ගෙන් සමුගෙන වෙන්ව ගියේය...
ජෝෂුවා ඇතුළු සෙනඟ මෝසෙස් තුමා යන දෙස ශෝකයෙන් බලා සිටියහ...
අවසන් කොටස ලබන සතියට

# ප්‍රහේලිකා අංක 50



## හරහට

1. දාවිත් රජතුමා මෙම තැනැත්තාගේ පුත්‍රයාය..

4.භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවන්තභාවයට එසවීමත් සමග 2015 .............. ශ්‍රී ලංකා කතෝලික අපට ඉතා වැදගත් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ මෙය පිළිබඳව ඉගැන්වීම් කළ සේක.

7. අන්ධයෙකුට මග පෙන්වීමට තවත් අන්ධයෙකුට බැරි බවත්, එවිට ඔවුන් දෙදෙනාම මෙවැන්නක වැටෙන බවත් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

8. ''මා අදහන යමෙක් වේද, ඔහුට කිසි කලෙක......................... නොවන්නේය. ''යි ක්‍රිස්තුන් වහනසේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ''දෙවිඳුනී ඔබගේ සිතුවිලි කොපමණ .......... ද? එහි අදහස් කොපමණ අසීමිතද? ''යි ගීතාවලියේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය.

10.සකේවුස්ට ක්‍රිස්තුන් වහන්සේව බැලීමට ගහකට නැගීමට සිදුවූයේ ඔහු මෙවැනි තැනැත්තෙකු වූ නිසාය.

11. යුවතියන් දස දෙනා පිළිබඳ උපමාවේ මෙය ඇති යුවතියන් සිය පහන් ගෙන යද්දී ඒ සමග තෙල් ගෙන ගියහ.

## පහළට

1. ජොෂුවා සහ ඊශ්‍රායෙල් ජනතාව දින සතක් මෙහි පවුර වටා ගමන් ගත් විට පවුර ඇද වැටිණි.

2. ''මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ මෙය ලබන්නට නොව කරන්නට යයි'' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

3. ''මාගේ ........................ කරට ගෙන, මාගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනය ලැබෙනු ඇත''යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස් තැනට සුදුසු වචනය.

6. ඊශ්‍රායෙල් ජනතාව මිසරයෙන් නික්ම යාමට පෙර මිසර වැසියන් වෙත දෙවියන් වහන්සේ එවන ලද වසංගත අතුරින් අට වන වසංගතය මෙම උවදුරයි.

08. කානාහි සරණ මංගල්‍යයේදී වතුර ...................භාජන හයක් ක්‍රිස්තුන් වහන්සේ මිදි යුෂ බවට පත් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. 1 සාමුවෙල් 16, ජෝෂුවා 6, නික්මයාම 10, ගීතාවලිය 139/17, ශු. මතෙව් 25/4, 5/21, 11/28, ශු. ලූක් 6/39 , ශු.ජුවාම් 2/6, 6/35

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා – කිරිමැටියාගාර**

**පසුගිය සතියෙන්.......**

### තමන් ......... තෙක් ........

**( සතුට ලබන්න කරුණු 20/20 ක් )**

11. යමක් හදිසියේ කිරීම තුළ අසතුටට පත්වනවාට වඩා තමන් නිවී සැනසිල්ලේ එය කිරීම යහපත් බව හැඟෙන තෙක්...

12. අසතුටට හේතුවන පුද්ගලයන් හා ස්ථාන කල් තියා තමන්ටම හඳුනා ගැනීමට හැකියාවක් ඇති තෙක්.....

13. තමන් හා එකඟ නොවන අය පරාජය කිරීමට යොමු නොවන තෙක්.....

14. සමාව දානය වෙනුවෙන් තමනට වෙහෙසක් දැරිය යුතු නැත. ඒ සඳහා තමනට ශරීරයෙන් කිසිවක් වැය නොවේ. එය හදවතින් කෙරෙන තෙක්...

15. යම් කාල පරිච්ඡේදයක් පුරා කිසියම් තීන්දුවකට තමන් නතු වී සිටියත් එය අවසන්වූ කළ සිතේ ඇතිවන කනස්සල්ල එසැනින් අවසන් කෙරෙන තෙක්.....

16. කුඩා දරුවෙකු දෙස බලන ආකාරයට ලොව දෙස බලන්නට තමන් ද ඒ වෙත යොමු වන තෙක්.....

17. වර්තමානය දෙස සුභදායි ලෙස බලන්නට තමන් හුරුවන තෙක්.....

18. සැහීමකට පත්වීමේ රහස එයට අදාළ පුද්ගලයා සතුවන දෙයක් වන අතර එහි සත්‍ය පිළිගනුයේ සීමිත සංඛ්‍යාවකි. මෙම රහස නිරවුල්ව තම මනසට කේන්ද්‍රගත වන තෙක්......

19. ''අඩුවෙන් ක්‍රියාකර වැඩියෙන් බලාපොරොත්තු වෙමු.'' යන පාඨයට වඩා ''වැඩියෙන් ක්‍රියා කර අඩුවෙන් බලාපොරොත්තු වෙමු.'' යන උද්ඝෝෂ පාඨය මගින් තම දිවි පැවැත්ම සකසාගන්නා තෙක්.....

20. අසීරුවෙන් දකිනා දැක්ම ලොව සීරුවෙන් තබනා බව තමන් විසින් ද මතකයේ තබා ගන්නා තෙක්....

**සිරිල් පෙරේරා මහතාගේ ''විස්සයි විස්ස'' ග්‍රන්ථයෙන් උපුටා ගැනුනි....**

# ළ.ක්‍රි.වී සෞන්දර්ය උළෙල















